<u>සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ</u>
<u>අඛණ්ඩ අධ්‍යාපන ආයතනයේ ආහාරපාන සැපයීමේ සේවාව සැපයීම</u>
<u>ටෙන්ඩර් කොන්දේසි</u>

01. ඔබගේ ලංසු ඉල්ලුම්පත්‍රය පිටපත් 02කින් සකස් කර මුල් පිටපත හා අනු පිටපත වෙන් වෙන්ව නම් කර මුද්‍රා තබා එකම කවරයක බහා 2026.02.10 දින පෙ.ව. 10.30 ට පෙර ලැබෙන සේ "ප්‍රධාන ප්‍රසම්පාදන නිළධාරි, ප්‍රසම්පාදන කළමනාකරණ ඒකකය , සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැපෙ. 13, ගැටඹේ, පේරාදෙණිය." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ප්‍රසම්පාදන කළමනාකරණ ඒකකයේ , ප්‍රසම්පාදන නිළධාරි භාරයේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "අඛණ්ඩ අධ්‍යාපන ආයතනයේ ආහාර පාන සැපයීමේ සේවාව සැපයීම සඳහා මිල ගණන් - 2026" ලෙස සඳහන් කළ යුතුය.

02. මිල ගණන් ඉදිරිපත් කිරීම අදාල අයදුම්පත්‍රය මගින් පමණක් සිදු කල යුතු අතර ඡායා පිටපත් භාර ගනු නොලැබේ.

03. එවනු ලබන ලංසු අයදුම්පතේ සිදු කර ඇති සියළුම වෙනස් කිරීම් සම්බන්ධයෙන් ලංසුකරු හෝ බලයලත් නියෝජිතයකු විසින් සම්පූර්ණ අත්සන් යොදා තිබිය යුතු අතර එසේ නොවන ලංසු අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. නියමිත දින නියමිත වේලාවෙන් පසුව එවනු ලබන ලංසු අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. ප්‍රසම්පාදන ඉල්ලුම්පත් සමග ආපසු ගෙවන රු.100,000.00 ක් වටිනා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක වන වාණිජ බැංකුවකින් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නමින් ලබා ගත් 2026.06.08 දින දක්වා වලංගු ලංසු සුරක්ෂණ සහතිකයක් හෝ මුදලින් රු.100,000.00 ක මුදලක් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ සරප් වෙත ගෙවා එහි රිසිට්පතේ මුල් පිටපත ලංසුලේඛන මුල් පිටපත සමග ඉදිරිපත් කල යුතු අතර ලංසු වලංගු කාලය 2026.05.10 දක්වා විය යුතුය

06. 2026.02.10 දින පෙ.ව. 10.30 ට .සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේදී ලංසු විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට ලංසු කරුවන්ට හෝ ඔහුගේ ලිපියකින් බලය පවරන ලද නියෝජිතයෙකුට ඔවුන්ගේ අනන්‍යතාවය තහවුරු කර එම අවස්ථාවට සහභාගී විය හැකිය.